# ග්‍රාමීය සංවර්ධනයේ අත්වැල

**සහභාගීත්ව වන වගාව**

**එච්. ජී. ගුණවර්ධන**

පරිසර සංරක්ෂණය අප සැමගේ අවධානය යොමු වී ඇති මූලික විෂයකි. ඒ සමගම වනාන්තර සංරක්ෂණය කෙරෙහිද අපගේ අවධානය යොමු වේ. වන සම්පත්වලින් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය සුළුපටු නොවේ. මෙය දළ වශයෙන් ජාතික ආදායමෙන් 4.5% ක් පමණ වන අතර වනාන්තර හා අනෙකුත් සම්පත්වලින් වාර්ෂිකව නිපදවෙන ද්‍රව්‍යවල වටිනාකම රුපියල් බිලියන 4.7 ක් පමණ වේ. එපමණක් නොව ග්‍රාමීය බලශක්ති අවශ්‍යතාවයෙන් 98% ක් ද නාගරික ප්‍රදේශවල 78% ක් ද සපුරා ගනුයේ ඉන්ධන දැව වලිනි. වනාන්තරවල දායකත්වය එසේ වුව ද වන විනාශය නිරන්තරව සිදු වෙමින් පවතී. එයට දර්ශීය හේතු දියහැකි වුවත් එය සමාජ ආර්ථික ප්‍රශ්න සමුදායක් වටා බැඳුනු සංකීර්ණ ප්‍රශ්නයක් බව ඒ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන විට වැටහේ. කෙසේ වුවද අද වන විට අප රට වනාන්තර ප්‍රතිශතය 23% දක්වා පමණ පහත වැටී ඇති අතර, වන විනාශයේ අහිතකර ප්‍රතිඵල දැනටමත් අප ඉදිරියේ පැහැදිලිව දිස්වෙමින් ඇත. පරිසර හානි දැඩි වී ඇති අතර දැව දඬු ආනයනය කිරීමට සිදුව ඇත. වසරකට දැව ඝන මීටර් මිලියන 1 ක් ද ඉන්ධන දැව ඝ. මී. මිලියන 13ක් පමණ ද අපගේ විවිධ කාර්යයන් සඳහා අවශ්‍ය වන අතර වාර්ෂිකව මෙම ඉල්ලුම 4% බැගින් ඉහළ යමින් පවතී. මෙම අවශ්‍යතා සැපිරීම රාජ්‍ය අංශයට පමණක් කළ නොහැකි බැවින් වන වගා කටයුතු සඳහා මහජන දායකත්වය ලබා ගැනීම සඳහා අවධානය යොමු කිරීම වර්තමාන යේ මූලික අවශ්‍යතාවයක් වේ.

## ප්‍රජා සහභාගීත්වය

සංවර්ධන උපාය මාර්ගවලදී "මහජන සහභාගීත්වය තුළින් සංවර්ධනය" ලගාකර ගැනීම මෑතක දී භාවිතයට ගැණුනු විශේෂ සංකල්පයකි. කෘෂිකාර්මික, වන සම්පත්, සෞඛ්‍ය, වාරිමාර්ග ආදී ඕනෑම ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී මහජන සහභාගීත්වයට ද්‍රමුඛස්ථානයක් ලැබේ. අපගේ බොහොමයක් සංවර්ධන සැලසුම් මෙතෙක් සකස් කර ක්‍රියාත්මක කර ඇත්තේ ඉහළ මට්ටමේ නිලධාරීන් විසින්. (Top Down Approach) නමුත් ඒවායින් ග්‍රාමීය ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට ලැබුණු විසඳුම් ඉතා මඳය. ප්‍රජා සහභාගීත්වය බොහෝ විට විදේශ ආධාර සපයන ආයතන ද ප්‍රමුඛව සළකා බලනු ලබන මූලික ලක්ෂණයකි. කෙසේ වුවද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය, මෙහෙයවීම හා ඇගයීම ආදී මූලික පියවරවලදී එම යෝජිත ව්‍යාපෘතිවලට සහභාගී වන අය (Participants) හෝ ප්‍රතිලාභ ලබන්නන් (Beneficieris) සහභාගී කර ගැනීම සහභාගීත්ව වැඩසටහන්වල මූලික ලක්ෂණයක් වේ.

1953 දී චීනයේ සභාපති මාඕසේතුංගේ මග පෙන්වීමෙන් ඇරඹි සිව් පාර්ශික වන වගා වැඩසටහන (Fourside Forestry Programme) සමාජ වන විද්‍යා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පියවරක් විය. ඉන්පසු ඉන්දුනීසියාවේ ඇරඹි මහජනතාව සඳහා වන වන වගා (Forestry for People) තායිලන්තයේ, බංගලිදේශයේ හා නේපාලයේ ඇරඹි ප්‍රජා වන වගා (Community Forestry) ආදී ව්‍යාපෘති සමාජ වන විද්‍යා වැඩසටහන්වල ආරම්භක පියවර විය.

ප්‍රජා සහභාගීත්ව වන වගා වැඩසටහන් ශ්‍රී ලංකාවේ ද මෑතකදී ක්‍රියාවට නැගුන අතර, එය නව අත්දැකීමක් විය. 1982 දී බදුල්ල දිස්ත්‍රික්කය පාදක කොට ක්‍රියාත්මක වූ ප්‍රජා වන වගා ව්‍යාපෘතිය මෙම නව ක්ෂේත්‍රයට යොමු වීම සඳහා දැමුණු මූලික අඩිතාලමක් විය.

මෑතකදී පිළිගෙන ඇති නව වන ප්‍රතිපත්තියෙහි හා මහා වන සැලැස්මෙහි විශේෂයෙන් සඳහන් කර ඇති සමාජයීය වන වගා සංකල්පය හා කෘෂි වන වගා ක්‍රමයන් මෙම සහභාගීත්ව වන වගා ව්‍යාපෘතියේ මූලික ලක්ෂණයන් වනු ඇත.

මෙවැනි වැඩසටහන් ප්‍රජා සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීමේදී එදිනෙද උපයන දෛනික ආදායමින් ජීවත්වන ගොවීන්ගේ සහාය ලබා ගැනීම සුළුපටු කාර්යයක් නොවේ. ආර්ථික ප්‍රතිලාභ ලැබීමට වසර 25 - 30 ක් වැනි දිගු කාලයක් ගත වීම එයට මූලික හේතුව වේ. මේ සඳහා වන ව්‍යාපෘතිය මගින් ඔවුන් දැනුවත් කිරීමත්, උනන්දු කිරීමත් අවශ්‍යවේ. නමුත් ව්‍යාපෘතිය හැරුණු විට සමාජ සජීවීකරණයේ අවශ්‍යතාවය මෙම ව්‍යාපෘතිය ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේදී මැනවින් පැහැදිලි වී ඇත. මේ සඳහා දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව පොළඹවන්නන් (Motivator) 260 ක් ග්‍රාමීය මට්ටමින් සේවයේ යොදවා ඇත.

## දැව හා වනජ නිෂ්පාදන

1993 වර්ෂයේ ආරම්භ කරන ලද සහභාගීත්ව වන වගා ව්‍යාපෘතිය ග්‍රාමීය සංවර්ධනයේ හා ග්‍රාමීය දුගී ජනතාවගේ ආදායම් ඉහළ නැංවීම සඳහා හා විරැකියාව අඩු කිරීම සඳහා ඉතා විශාල ලෙස දයක වී ඇත. එමෙන් ම කෘෂිකාර්මික ඉඩම් හිඟ අඩු කිරීමට ද හේතු වී ඇත. දැව, ඉන්ධන දැව හා වනජ නිෂ්පාදන ඉහළ නංවා ගෘහ අවශ්‍යතා සපයමින් තුරු වැස්ම වැඩි කිරීමත්, පරිසර සංරක්ෂණයත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. අසංවර්ධිත ගෙවතු සංවර්ධනය, රජයේ ඉඩම්වල (අත් හැර දමන ලද හේන් හා තේ වගාවන්) ග්‍රාමීය ජනතා සහභාගීත්වයෙන් වන වගා කරවීම, සංරක්ෂණ කළයුතු බෑවුම්, ගංගාධාර, ආදියේ ආරක්ෂක බිම් කට්ටි පිහිටුවීම හා මහාමාර්ග දෙපස, වෙරළබඩ තීරු, නාගරික බිම් කට්ටි ආදියෙහි පරිසර සංරක්ෂණය සඳහා වන යොමු පිහිටුවීම මෙම ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරන මූලික සංරචකයන් වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව හා ඕස්ට්‍රේලියානු රජයෙන් අවශ්‍ය මූලික ප්‍රතිපාදන සපයයි.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වියදම ඩොලර් මිලියන 25 කි. අම්පාර, අනුරාධපුර, බදුල්ල, ගාල්ල, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර , යන දිස්ත්‍රික්කවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නමුත් විශාල වශයෙන් වන වගාව සඳහා සුදුසු ඉඩම් තිබීමත්, යැපුම් ගොවිතැන මත යැපෙන ගොවීන් විශාල වශයෙන් සිටීමත් යන කරුණු හේතුකොටගෙන වියළි කලාපයට ප්‍රමුඛත්වයක් දී ඇත. ඒ ඒ වර්ෂවල වගා කර ඇති ගෙවතු, ගොවි වන වගා හා විවිධ වන වගා පිළිබඳ විස්තර පහත දැක්වේ.

මේ දක්වා වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 15000 ක් පමණ වේ. මෙයින් වඩාත් ජනප්‍රිය වී ඇත්තේ ගොවි වන වගාවන් ය ඉහත ව්‍යාපෘතිය යටතේ ගොවි වන වගා සඳහා විශාල උද්‍යෝගයක් ඇති වී ඇති අතර, මෙම ව්‍යාපෘතිය යටතේ ගොවි පවුල් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබාගෙන ඇත.

**ආර්ථික දායකත්වය**

දැනට හෙක්ටයාර 5000 ක පමණ ගොවි වන වගා පිහිටුවා ඇති අතර, එම ඉඩම් හිමිකරුවන් අනාගතයේදී ලක්ෂපතියන් වනු ඇත. වර්තමානයේ පවත්නා මිල හා උද්දමන වේගය සළකා තව වසර 25 කින් තේක්ක ගසක වටිනාකම ගණනය කළ විට රු : 25,000/- ක් පමණ වේ. මේ අනුව හෙක්ටයාර 1 කින් තේක්ක ගස් 300ක දී ඔහුට ලැබෙන ආදායම රුපියල් මිලියන 7.5 ක් පමණ වේ. මේ අනුව සැලකූ කල වර්තමානයේ ඉදිකිරීම් කර්මාන්තය හා තුනීලෑලි ආදිය සඳහා ආනයනය කරනු ලබන දැව ප්‍රමාණය සඳහා වැය කරන විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සැළකිය යුතු ලෙස දායක වනු ඇත.

කඳුකරයේ සහ ජලාධාර ප්‍රදේශවල ඇති අත්‍යවශ්‍යයෙන්ම සංරක්ෂණය කළයුතු සෝදා පාළුවට භාජනය වන බෑවුම් ඉඩම් මෙම ව්‍යාපෘතිය මගින් සංවර්ධනය සඳහා තෝරා ගැනීමේදී ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. ගංගා, ඇළදොළ දෙපස තීරු ද, වැව් තාවුලු හා පෝෂක ප්‍රදේශ ද මෙමගින් වන වගා කර සංරක්ෂණය කරනු ඇත

**ආහාර ආධාර වැඩසටහන**

ගොවි වන වගා හා ආරක්ෂක වන වගා සඳහා රජයේ මුඩු ඉඩම් හෙක්. 1/2 සිට හෙක්. 01 දක්වා ප්‍රමාණයක් ගොවීනට ලැබේ. මෙම ඉඩම් ලබා දෙනුයේ ගිවිසුමක් යටතේ වන අතර ගොවි වන වගා සඳහා දෙනු ලබන ඉඩම් වසර 25 ක කාලයක් සඳහා ලැබේ. ආරක්ෂක වන වගා සඳහා ඉඩම් වසර 05 ක කාලයක් සඳහා දක්වා ලැබෙන අතර ඉන් පසුව ද ඉඩම් කට්ටිකරුවන්ගේ ඉල්ලීම මත ගිවිසුම දීර්ඝ කල හැකිය. මෙම වගාවල බිම් සැකසීම, පැල සිටුවීම, පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම, වැටවල් ඉදිකිරීම, ආරක්ෂා කිරීම ආදිය සඳහා හෙක්. 1 කට රුපියල් 32,000/- වටිනා ආහාර ආධාර ලැබේ. මෙම ආහාර ආධාර වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනුයේ ඕස්ට්‍රේලියාවේ AUSAID ආයතනයේ ආධාර යටතේය. වන වගා වැඩ කටයුතු වලදී ගොවීන් ඉටු කරන වැඩ කොටස් ගණනය කර ඔවුන් වෙත කුපන්පත් නිකුත් කරනු ලැබේ. එක් දිනයක් වැඩ කිරීම වෙනුවෙන් ලැබෙන කූපනයක වටිනාකම රු : 127/- කි. ඒවා තම ප්‍රදේශයේ සමූපකාර ප්‍රාදේශික වෙත ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගත හැකිය.

මෙම ව්‍යාපෘතිය යටතේ 1993 - 1996 දක්වා ප්‍රතිලාභීන් අතර ලබාදී ඇති ආහාර ආධාරවල වටිනාකම රුපියල් මිලියන 84 කි. 1998 වර්ෂය අවසන් වන තෙක් ලබා දුන් ආහාර ආධාරවල වටිනාකම රුපියල් මිලියන 256 ක් වේ. මෙය දුෂ්කර ප්‍රදේශවල වෙසෙන දුගී ජනතාවගේ කුසගින්න නිවීමටත් දරිද්‍රතාවයෙන් මදකට හෝ ඔවුන් මුදවා ගැනීමටත්, ඉවහල් වෙනු නොඅනුමානය.

**තවාන් වැඩසටහන**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙයට වර්ෂ ගණනාවකට පෙර ආරම්භ කරන ලද විවිධ ව්‍යාපෘති සඳහා පැල නිෂ්පාදනය කරනු ලැබුයේ දෙපාර්මේන්තුවේ ඒ ඒ දිස්ත්‍රික්ක වල පිහිටි මධ්‍යම තවාන්වලිනි. නමුත් මෙම සහභාගීත්ව වන වගා වැඩසටහන සඳහා අවශ්‍ය මුළු පැල ප්‍රමාණයෙන් 60 - 75% ක් පමණ නිපදවනුයේ පුද්ගලික, ග්‍රාමීය, පාසල් හා ස්වේච්ඡා කණ්ඩායම් මගින් පවත්වාගෙන යන තවාන් මගිනි. මේ අනුව 1996 වසරඅවසානය දක්වා පැල මිලියන 15 ක් පමණ නිපදවා ඇත. මෙම නිපදවන පැල අතරට දෙහි, දෙඩම්, රඹුටන්, අලිපේර, දූරියන් ආදී පළතුරු වර්ගත්, මැහෝගනි, තේක්ක, හල්මිල්ල, ලුනුමිදෙල්ල, හවරිනුග, කායා වැනි කෙටි කලකින් දැව ලබාගත හැකි වර්ගත් ඇතුළත් වේ. එමෙන් ම ගම්මිරිස්, කෝපි, කරාබු ආදී අපනයන භෝග පැලද ඇතුළත්ය. ඉදිරි වර්ෂ දෙක තුළදී මෙවැනි විශේෂවල තවත් පැල මිලියන 12ක් පමණ නිපදවනු ඇත. මෙම පැලයක් රු : 2.50 බැගින් මිළදී ගෙන ඇති අතර, එමගින් පමණක් රුපියල් මිලියන 37 ක් පමණ රැකියා නොමැති මෙම තවාන් පවත්වාගෙන යන දුගී ග්‍රාමීය ජනතාව වෙත ගෙවා ඇත. මෙලෙස මිලදී ගන්නා පැල මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලබන වන වගා සඳහා යොදා ගනු ලැබේ. මෙම තවාන්කරුවන් ඉදිරියේදී ස්වයං රැකියාවක් ලෙස තවාන පවත්වා ගෙන යාමට උනන්දු කරවනු ලැබේ.

**ග්‍රාමීය සංවර්ධනය**

ආහාර ආධාරවලින් පමණක් නොව මෙම ගොවි වන වගා හා ආරක්ෂන වන වගා බිම් කට්ටිවල කෙටිකාලීන කෘෂ බෝග වගා කිරීමෙන් එම ගොවීන් එක් කන්නයකදී (හෙක්. 1/2 කට රු: 15,000/- සිට රු : 45000/- ක් දක්වා අමතර ආදායමක් ලබාගෙන ඇත. කව්පි, මුං, උඳු, තල, රටකජු, බඩඉරිගු, මිරිස් ආදිය මෙලෙස බහුලව වගා කරන බෝගයන් වේ. ආරම්භයේදී ආහාර ආධාර වැඩසටහන යටතේ ලබාදෙන ලද ද්‍රව්‍ය ආහාර ද්‍රව්‍යවලට පමණක් සීමා වුවද පසුව ඒ වෙනුවට පොත්පත්, කෘෂිඋපකරණ, පොහොර හා ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. ආහාර ද්‍රව්‍ය වෙනුවට ඉහත ද්‍රව්‍ය මිලදී ගැනීමට ගොවීන් විශාල ලෙස පෙළඹී ඇති බව අපට පෙනී ගොස් ඇත. මෙම වැඩසටහන ග්‍රාමීය ආර්ථිකයේ විශේෂ ස්ථානයක් ගෙන ඇති අතර, ග්‍රාමීය කාන්තාවන්ට තම ජීවිතයේ සිහිනයක් පමණක් වූ ස්වර්ණාභරණ මිලදී ගැනීම, නිවාස ඉදිකිරීම, වෙනත් ගෘහ අවශ්‍යතා සපයා ගැනීම හා දූ දරුවන්ට අවශ්‍ය දෑ මිලදී ගැනීමට හැකිවීම මෙම ව්‍යාපෘතියෙන් ලද විශේෂ ඵල ප්‍රයෝජන වේ.

**සාමුහික ව්‍යාපෘති**

මෙම වන වගා වැඩසටහන් ක්‍රියාත්මක වනුයේ සාමූහික ප්‍රයත්නයන් තුළිනි. වන වගාවන් ක්‍රියාත්මක වන ප්‍රදේශයක ගොවීන් කණ්ඩායමක ලෙස සංවිධානය කරන අතර ඔවුන් විසින් සැළසුම් කර ක්‍රියාත්මක් කිරීම තුළින් මෙම වැඩසටහන් දියත් වේ. මෙම සංවිධාන විසින් ම අධීක්ෂණය, මෙහෙයවීම හා ව්‍යාපෘතිය අගැයීම සිදුවන බැවින් මෙම වැඩසටහන් ග්‍රාමීය ජනතාවගේ ම ක්‍රියාදාමයන් ලෙස ඔවුන්ගේ නිෂ්පාදන අලෙවියෙන් හා දිරිදීමනා මුදලින් අරමුදල් පිහිටුවා ඇති අතර, සමහර ගොවි සංවිධාන මගින් පිහිටුවා ඇති අතර අරමුදල් ප්‍රමාණයෙන් රු: 60,000/- දක්වා පමණ වේ.

## ඒකාබද්ධව කටයුතු කරනු ලබන ආයතන

මහජන බැංකුව, සමුපකාර දෙපාර්තමේන්තුව, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, ජ්‍රිමා කම්හල, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික සැළසුම් අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සහයෝගීව කටයුතු කරන සහෝදර ආයතනයන් වේ. ආහාර ආධාර වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සමුපාකාර දෙපාර්තමේන්තුව හා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක ම පිහිටි සමුපකාර ප්‍රාදේශික විසින් ඉටු කරනු ලබන සේවය අපමණය. මහජන බැංකුව ද අරමුදල් කලට වේලාවට බෙදා හැරීම සඳහා කටයුතු කරයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සහයෝගීව කටයුතු කරන ආයතන අතර මිහිදිය ව්‍යාපෘතිය, මහවැලි සංවර්ධන අධිකාරිය, ජාතික වාරි කළමණාකාරිත්ව ආයතනය හා මිහිදිය ආයතනය විශේෂ ස්ථානයක් ගනී. මෙම ආයතන හා ඒකාබද්ධව දිස්ත්‍රික් ගණනාවක ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

## නව ප්‍රවනතා

ආරක්ෂක හා ගොවි වන වගාවල ප්‍රධාන සීමාකාරී සාධකයක් වන්නේ මුල් වසර 04 තුළ දී පමණක් දිරිදීමනා ලැබීමත් එමෙන් ම මුල් කාලය තුළදී පමණක් අතුරු බෝග වගාවලින් ආදායම් ලබා ගැනීමට හැකි වීමත්ය. දැව ශාක වැඩීමත් සමග පොළොව ආවරණය වීමෙන් වෙනත් වගාවන් සඳහා අවශ්‍ය ආලෝකය නොලැබීම මෙයට හේතු වේ. මේ නිසා සිව් වන වසරින් පසු එම වගාවන් හා නිරන්තරව ගොවීන් එක්ව තබා ගැනීම සඳහා වාර්ෂික අතුරු බෝග වගාවන් සඳහා උනන්දු කිරීමට දැනටමත් කටයුතු යොදා ඇත. බෙලි, දිවුල්, කජු, අඹ, දොඩම්, සියඹලා, දෙහි, පැෂන් වැනි පළතුරු වර්ගත් කිතුල්, උණ, වේවැල්, පුවක් වැනි වර්ග වගා කරවීමටත් ඔවුන් පෙළඹවීමට දැනට කටයුතු කරගෙන යයි. මේ හැරුණු විට මීමැසි පාලනය, ගව පාලනය සඳහා තෘණ වගාව, සිට්‍රනෙල්ලා තෘණ වගාව ආදී විවිධ ව්‍යවසායයන් බිම් කට්ටිවල ආරම්භ කිරීමටත් ඔවුන් දැනටමත් පෙළඹී ඇත.

මෙම ගොවි සංවිධාන විසින් රැස් කර ඇති අරමුදල් ආයෝජනයට ද ඔවුන් කටයුතු කරගෙන යයි. ගව පාලනය, එළු පාලනය, කුකුලන් ඇති කිරීම, ඇදුම් මැසීම ආදී විවිධ ව්‍යාපෘති සඳහා අද ගොවීන් යොමු වෙමින් සිටී. තම වගා කටයුතු සඳහා අවශ්‍ය ට්‍රැක්ටර්, ජලපොම්ප ආදිය මිලදී ගැනීමටත් මෙම ගොවීහු උනන්දු වෙමින් සිටිති.

කලකට ඉහත දී අනවසර දැව කැපීම්වල හා අනවසරයෙන් ලද ඉඩම් එළි කිරීම්වල යෙදී සිටි ගම්වැසියන් අද වන වගාවල යෙදී සිටී. අනුරාධපුර, කහටගස්දිගිලිය, මිහින්තලේ, සීගිරිය, ගලෙන් බිඳුනුවැව, බදුල්ල,-නිකපිටිය, කන්දේගම හා හම්බන්තොට සූරියවැව ආදී ප්‍රදේශවල ප්‍රජා සහභාගිත්ව වන වගා කටයුතුවල නියැලි ගොවීන් අද ඒ බැව් පිළිගනී. මෙය දැවැන්ත සමාජ පරිවර්තනයක් වන අතර, වන වගා ක්ෂේත්‍රයේ නව පෙරලියකි. වන වගාව සඳහා පමණක් නොව වන කළමනාකරණය හා සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම මීළඟ පියවර වනු ඇත. වියලි කලාපයේ ස්ථාපනය කර ඇති වන වගා බිම්වල දිගුකාලීනව අතුරු බෝග වගාව කරගෙන යාම සඳහා ගොවීන් විශේෂ උනන්දුවක් දක්වයි. අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වන වගාවල අතුරු භෝග වගාව සඳහා ජල පහසුකම් සැපයීම සඳහා කෘෂි ළිං ලබා දීමට කෘෂි සංවර්ධන අධිකාරිය දැනටමත් පියවර ගෙන ඇත.

ව්‍යාපෘතියට ආධාර සපයන ආයතන වන ආසියානු සංවර්ධන බැංකුව හා ඕස්ට්‍රේලියානු රජය මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලබන වන වගා පිළිබඳ සෑහීමකට පත් වී ඇති අතර, ව්‍යාපෘතියෙහි දෙවන අදියර සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට දැනටමත් එකඟ වී ඇත.

